# රජයේ විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය
# GOVT. RADIOLOGICAL TECHNOLOGISTS' ASSOCIATION
# அரச கதிரியல் தொழில்நுட்பவியலாளர் சங்கம்

Trade Union No: 814, Founded On 4th July 1948

OFFICE ADDRESS : 247, MADIWELA ROAD, UDAHAMULLA, NUGEGODA.
TEL : GEN. SECRETARY - 071 4426998 PRESIDENT - 071 8658620


මගේ අංකය : 24/TUA/25-26

**කඩිනම් අවධානය පිණිසයි.**

05.02.2026

වෛද්‍ය හංසක විජයමුණි,
නියෝජ්‍ය අමාත්‍ය,
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ.

නියෝජ්‍ය අමාත්‍යතුමනි,

**මාලිගාවත්ත වකුගඩු රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට (රා.ආ.) එරෙහි විමර්ශනය බලපෑම්වලින් තොරව සිදු කිරීමට එම නිලධාරියා අදාළ රෝහලෙන් ඉවත් නොකිරීම සම්බන්ධවයි.**

**ඔබතුමා සමග මෙම ගැටලුව පිළිබඳව 2026.01.21 වැනිදා සහ 2026.01.27 වෙනිදා පැවති සාකච්ඡාවන් හා බැඳේ.**

අවසන් වරට ඔබතුමා සමඟ 2026.01.27 වෙනිදා පැවති සාකච්ඡාවේදී මෙම ගැටලුවට අදාළ රාජකාරී ආවරණයේ නිරත පුද්ගලයාට එරෙහිව සිදුකරන විමර්ශනය ස්වාධීනව පැවැත්වීම සඳහා ඔහු තාවකාලිකව හෝ එම රෝහලෙන් ඉවත් කිරීමේ තීරණය, පැය 48 ක් ඇතුලත මූලික විමර්ශනයේ අතුරු වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව සිදුකරන බවට ලිඛිතව එකඟතාවය ලබා දී ඇත.(අංක **MOHMM/MO/DM/2026/01/02/P** හා 2026.01.27 දිනැති ලිපිය)

ඔබතුමා පොරොන්දු වූ පරිදි ම මූලික විමර්ශනයේ අදාළ අතුරු වාර්තාව පැය 48 ක් ඇතුළත ලබා ගත් බවත් එහි නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බවට අපහට තොරතුරු වාර්තා වී ඇති අතරම එය ඔබතුමන් විසින් අප සමග සිදු කළ සාකච්ඡාවලදී ද ප්‍රකාශ කොට ඇත.

2026 ජනවාරි 29 වනදා විට ලබාගත් අතුරු වාර්තාවට අනුව ඔබතුමන් විසින් ලබාදුන් උපදෙස් මේ වනතෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ම ඉටුකර නොමැති බව කණගාටුවෙන් යුතුව දන්වා සිටිමි. එමෙන්ම මේ පිළිබදව බලවත් සැකයක්ද මතුවන බව පෙන්වා දෙමි.

**මෙම සිද්ධියට සම්බන්ධ පුද්ගලයා 2024 වර්ෂයේ සිටම සිදුකළ වැරැදි සම්බන්ධයෙන් ලිඛිතව පැමිණිලි කළ ද ඔහුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක නොකළේ ද මෙම සෞඛ්‍ය බලධාරීන්ම බවද සිහිපත් කරන අතර මෙම අවස්ථාවේ ද එම අදිසි හස්තයන් වැරදිකරුවා ආරක්ෂා කිරීමට සහ එමගින් වෘත්තිකයන් වර්ජන ක්‍රියාමාර්ගවලට කැඳවන බවද පෙනී යයි.**

මෙම තත්ත්වය යටතේ අප සංගමයට තාවකාලිකව අත්හිටවූ වෘත්තීය ක්‍රියාමාර්ගය නැවත ආරම්භ කරනවා හැර වෙනත් විකල්පයක් නොමැති බව පැහැදිලි කරුණක් වී ඇත. එම නිසා නැවතත් **2026.02.09 වන සඳුදා දින සිට වෘත්තීය ක්‍රියාමාර්ග නැවත ආරම්භ කිරීමට අප විධායක සභාව විසින් තීරණය කර ඇත.**

**මෙම ගැටලුව විසඳීමට නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස ඔබතුමා පූර්ණ මැදිහත්වීම සිදුකළද ඊට අදාළ නියෝග ක්‍රියාත්මක කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් විසින් චේතනාන්විතවම පැහැර හරිමින් සිටින බැවින්, ඒ පිළිබඳව කඩිනමින් සොයා බලා මෙම ගැටලුව විසඳීමට කඩිනමින් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි. ගැටලුවට අදාල මෙම තත්ත්වය සාකච්ඡා කිරීම සඳහා කඩිනමින් අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.**

ස්තූතියි !
මෙයට - විශ්වාසී,

CHANAKA DHARMAWICKRAMA
President
Gov. Radiological Technologists' Association
hwchanaka@gmail.com

චානක ධර්මවික්‍රම
සභාපති

පිටපත් :
1. වෛද්‍ය නලින්ද ජයතිස්ස - සෞඛ්‍ය අමාත්‍යතුමා
2. විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ - සෞඛ්‍ය ලේකම්
3. අතිරේක ලේකම් (පාලන 1)
4. අතිරේක ලේකම් (පාලන 2)
5. විශේෂඥ වෛද්‍ය අසේල ගුණවර්ධන - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
6. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (විමර්ශන)
7. සියලුම සාමාජිකයන්